අ.පො.ස උසස් පෙළ

# දේශපාලන විද්‍යාව



## දේශපාලන න්‍යාය

## 2.3 දේශපාලන න්‍යාය

සමාජයේ සිදුවන සංසිද්ධි එසේ සිදුවන්නේ මන්දැයි පැහැදිලි කිරීමට සහ විග්‍රහ කිරීමට ශාස්ත්‍රඥයන් භාවිත කරන විධික්‍රමික මෙවලමක් හැටියට "න්‍යාස" යන සංකල්පය නූතන දේශපාලන හා සමාජ චින්තනයේ දී භාවිත කරනු ලබයි.

උදාහරණ කිහිපයක් පහත වගුවෙන් දැක්විය හැකිය.

| සිදුවීම | අධ්‍යයන කේන්ද්‍රය | න්‍යාය |
|---|---|---|
| අකාශයට ඇතුළුවන ද්‍රව්‍යයක් මහ පොළව මතට පතිත වන්නේ ඇයි? වෙනත් දිශාවකට ගමන්නොකරන්නේ ඇයි? | භෞමිකවාදය | ගුරුත්වාකර්ෂණ න්‍යාය |
| වෙළඳපොළේ භාණ්ඩ හිගවන විට ඒවායේ මිල ඉහළ යන්නේ ඇයි? | ආර්ථික විද්‍යාව | ඉල්ලුම සැපයුම පිළිබඳ න්‍යාය |
| මිනිසුන් පරිසරය අභිබවා හොයා යුත්තේ ඇයි? | භූගෝල විද්‍යාව | නියතිවාදී න්‍යාය |
| සමාජ ආර්ථික පරිවර්ථනය සිදුවන විට සමහර සමාජ කොටස් අතර ක්‍රම විරෝධි හැඟීම් සහ කැරළි ඇති වන්නේ ඇයි? | දේශපාලන විද්‍යාව | සාපේක්ෂ විහීනතා න්‍යාය |

- දේශපාලන විද්‍යාවේ න්‍යාය යන සංකල්පයට අර්ථ දෙකකි.

01. ප්‍රතිමානී න්‍යාය (Normative Theory)

02. විද්‍යාත්මක න්‍යාය (Scientific Theory)



The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

## ප්‍රතිමානීය න්‍යාය


✓ **දේශපාලන දර්ශනය හා දේශපාලන චින්තනය සමඟ අනන්‍ය වී ඇති න්‍යාය ප්‍රතිමානීය න්‍යායයි.**

එය ප්ලේටෝගේ සිට වර්ථමානයේ පවතින දේශපාලන දර්ශන සම්ප්‍රදාය සමඟ සම්බන්ධ වී ඇත.

දේශපාලන දර්ශන සම්ප්‍රදාය දේශපාලන න්‍යාය ලෙස ඉදිරිපත් කර තිබෙන්නේ ප්‍රධන වශයෙන්,

- **දේශපාලනය**
- **රාජ්‍යය**
- **දේශපාලන බලය**
- **ආණ්ඩුකරණය**
- **රාජ්‍යය ප්‍රතිපත්ති**

කෙසේ විය යුතදැයි යෝජනා කරන සෛද්ධාන්තික මූලධර්මය ය.(Axiomatic Principles)





The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## විද්‍යාත්මක න්‍යාය

- දේශපාලන විද්‍යාවට විද්‍යාත්මකත්වය පිළිබඳ න්‍යායාත්මක අදහස එකතුවූයේ 1930 දශකයේ ය. එය සමාජයීය විද්‍යාවන්ගේ **"විද්‍යාත්මක හැදෑරීම"** පිළිබඳ පසුබිමෙනි. මෙම විද්‍යාත්මකවාදී සමාජීය විද්‍යා සම්ප්‍රදායෙහි දී න්‍යාය යන්න අර්ථකථනය කරනු ලබනුයේ, ස්වාභාවික විද්‍යා සම්ප්‍රදායෙහි දී න්‍යාය සංකල්පගත කළ ආකාරයටම ය

- එනම්, න්‍යායේ කාර්යය වන්නේ ලෝකයේ සිදුවන දේ එසේ සිදුවන්නේ මන්දැයි එසේ සිදුවන නීතියකට අනුව පැහැදිලි කිරීමය.

- න්‍යාය යනු එවැනි නීති ගොඩනැගීමකි. ඒ අනුව න්‍යායක් යනු ස්වාභාවික හෝ සමාජ හෝ ලෝකයේ සිදුවන දේ පැහැදිලි කිරීමේ නීතයකි.

- විද්‍යාඥයින් තම පරීක්ෂණ මගින් න්‍යාය ගොඩ නගන්නේය යන්නෙහි අර්ථය ආනුභවික දත්ත සහ සාක්ෂ්‍ය නිරීක්ෂණයට සහ විශ්ලේෂණයට භාජනය කර **"නීති"** පද්ධති ගොඩනැගීමය.

සමාජීය විද්‍යාවේ ප්‍රත්‍යක්ෂ මූලවාද රාමුව ඇතුළත ගොඩනැගුණ බැවින් දේශපාලන විද්‍යාවේ මෙම න්‍යායික ධාරාව හඳුන්වන්නේ ප්‍රත්‍යක්ෂමූලවාදී දේශපාලන විද්‍යා න්‍යාය යනුවෙනි. (Positivist Political Theory)

- **චර්යාවාදය**
- **තුළනාත්මක දේශපාලන විද්‍යා විග්‍රහය**
- **දේශපාලන නවීකරණය**
- **දේශපාලන ක්‍රම පද්ධති**


Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

වර්තමාන දෙශපාලන විද්‍යාවේදී ප්‍රතිමානීය සහ විද්‍යාත්මක යන ප්‍රවේශ දෙකම භාවිත වේ. මේ අතර 20 සියවසෙහි පැවති සහ මත ධාරා ගණනාවකින් ම සමන්විත එකක් බව ද අපට නිරීක්ෂණය කළ හැකි ය. එවැනි ප්‍රධාන න්‍යායික ධාරා පහත ලෙස දැක්විය හැකි ය.

1. **ලිබරල් දේශපාලන න්‍යාය**
2. **සමූහාණ්ඩුවාදී දේශපාලන න්‍යාය**
3. **මාක්ස්වාදී දේශපාලන න්‍යාය**
4. **පශ්චාත් - මාක්ස්වාදී දේශපාලන න්‍යාය**
5. **දේශපාලන නවීකරණ න්‍යාය**
6. **ස්ත්‍රීවාදී දේශපාලන න්‍යාය**
7. **පශ්චාත් - නූතනවාදී / පශ්චාත් ව්‍යුහවාදී දේශපාලන න්‍යාය**
8. **පශ්චාත් - යටත්විජිතවාදී දේශපාලන න්‍යාය**


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk